SRI LANKA

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# අදියර III විභාගය - 2025 ජූලි

## යෝජිත උත්තර

# (303) මූල්‍ය පාලනයන් සහ විගණනය (FCA)

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**
නො. 540 , පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.
දුරකථන : 011-2-559 669

මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2025 ජූලි

## (303) මූල්‍ය පාලනයන් සහ විගණනය

## යෝජිත උත්තර

(මුළු ලකුණු 20)

**A කොටස**

### *1 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

**පරිච්ඡේදය 01**

**(a)**

- ඉහල විනිවිදභාවය
- ඉහල වගවීම
- මෙහෙයුම් කාර්යක්ෂමතාව
- අවදානම් සඳහා වඩා හොඳින් ප්‍රතිචාර දැක්වීමේ හැකියාව
- වැරදි කළමනාකරණයට ඇති ඉඩකඩ අඩු වීම
- වඩා හොඳ තීරණ ගැනීම
- ආචාර ධර්මානුකූල හැසිරීම් ප්‍රවර්ධනය කිරීම
- කීර්තිනාමය වැඩි වීම
- කොටස් මිල කෙරෙහි ධනාත්මක බලපෑම
- සේවකයින් සහ කොටස්කරුවන් අතර විශ්වාසය වර්ධනය කිරීම

*(වාසි තුනක් පමණක් ප්‍රමාණවත්ය)*

***(ලකුණු 03)***

**(b)**

1. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකුලව ලැයිස්තුගත සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම් වල ප්‍රමාණවත් බව අධීක්ෂණය කිරීම.
2. මූල්‍ය වාර්තාකරණයට අදාළ රෙගුලාසි සහ අවශ්‍යතා, සමාගම් පනතේ තොරතුරු අවශ්‍යතා සහ අනෙකුත් අදාළ මූල්‍ය වාර්තාකරණයට අදාළ රෙගුලාසි සහ අවශ්‍යතා සමඟ ආයතනයේ අනුකූලතාවය අධීක්ෂණය කිරීම.
3. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වල අවශ්‍යතා සපුරාලීමට ආයතනයේ අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණය ප්‍රමාණවත් බව සහතික කිරීම සඳහා ක්‍රියාවලි අධීක්ෂණය කිරීම.
4. ආයතනයේ බාහිර විගණකවරුන්ගේ ස්වාධීනත්වය සහ කාර්ය සාධනය තක්සේරු කිරීම.
5. බාහිර විගණකවරුන් පත් කිරීම, නැවත පත් කිරීම සහ ඉවත් කිරීම පිළිබඳව අධ්‍යක්ෂක මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම සහ බාහිර විගණකවරුන්ගේ වේතන සහ කාර්යභාර කොන්දේසි අනුමත කිරීම.

*(කාර්යයන් දෙකක් පමණක් ප්‍රමාණවත්ය)*

***(ලකුණු 02)***

***(මුළු ලකුණු 05)***

## *2 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

| පරිච්ඡේදය 09 |
|---|

**(a)** විගණන ආයතනය සහ එහි කාර්ය මණ්ඩලය අදාළ ආචාර ධර්ම අවශ්‍යතාවලට අනුකූල වන බවට සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා නිර්මාණය කර ඇති ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ආයතනය විසින් ස්ථාපිත කළ යුතු අතර, ඒවාට ඇතුළත් වන්නේ:

a) අවංක බව
b) අරමුණුගතභාවය
c) වෘත්තීය නිපුණත්වය සහ නිසි සැලකිල්ල
d) රහස්‍යභාවය
e) වෘත්තීය හැසිරීම

*(ලකුණු 03)*

**(b)**
- වෘත්තීය අධ්‍යාපනය
- පුහුණුව ඇතුළුව අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය
- සේවා පළපුරුද්ද
- වඩා පළපුරුදු කාර්ය මණ්ඩලයක් විසින් පුහුණු කිරීම
- ස්වාධීන වීමට අවශ්‍ය පිරිස් සඳහා ස්වාධීනත්වය පිළිබඳව දැනුවත් කිරීම

*(ආකාර දෙකක් පමණක් ප්‍රමාණවත්ය)*

***(ලකුණු 02)***

***(මුළු ලකුණු 05)***

## *3 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

| පරිච්ඡේදය 08 සහ 04 |
|---|

**(a)**

1. **ස්වාධීනත්වය සහ ඇල්ම මත ගැටුම (ආචාර්ය ධර්ම සලකා බැලීම)**
   විගණන ආයතනයට දැනටමත් මව් සමාගම වන Reliance Constructions (පෞද්ගලික) සමාගමේ බාහිර විගණක ලෙස කටයුතු කර ඇති බැවින්, විශේෂයෙන් අන්තර් සමාගම් ගනුදෙනු හෝ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ වන්නේ නම්, ස්වයං සමාලෝචන තර්ජනයක් සහ ඇල්ම මත ගැටුමක් ඇතිවීමේ අවදානමක් පවතී. අරමුණුගතභාවය සහ ස්වාධීනත්වය පවත්වා ගැනීම සඳහා ප්‍රමාණවත් ආරක්ෂණ ක්‍රම (වෙනම විගණන භාර කණ්ඩායම් වැනි) ක්‍රියාත්මක කළ හැකිද යන්න විගණකවරයා ඇගයීමට ලක් කළ යුතුය.

2. **විගණනය සඳහා නිපුණතාවය සහ සම්පත් (ප්‍රායෝගික සලකා බැලීම්)**
   විගණන ආයතනය අවශ්‍ය තාක්ෂණික විශේෂඥතාව සහ කර්මාන්ත දැනුම ඇති බව සහතික කළ යුතුය, විශේෂයෙන් සූර්ය බලශක්ති අංශයේ, එයට නියාමන අනුකූලතාව (උදා: ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ අවශ්‍යතා සමඟ) සහ අර්ධ වශයෙන් හෝ බොහෝ දුරට සම්පූර්ණ කරන ලද සූර්ය ව්‍යාපෘති වලින් ආදායම් හඳුනා ගැනීම ඇතුළත් විය හැකිය.

3. **ව්‍යාපාරය සහ එහි පරිසරය අවබෝධ කර ගැනීම**
   සේවාදායකයාගේ ව්‍යාපාරය, කර්මාන්ත සහ රෙගුලාසි පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගැනීම.

4. **සමාගමේ මූල්‍ය ස්ථාවරත්වය සහ කීර්තිනාමය**
   වෙළඳපොළ තුළ සේවාදායකයාගේ ස්ථාවරත්වය සහ කීර්තිය සලකා බැලීම.

5. **ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූල නොවීමේ අවදානම**

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ලියාපදිංචි වීමට අපොහොසත් වීම, අනුකූල නොවීමක් බැවින් සමාගමට නීතිමය බලපෑම් ඇති කළ හැකිය. මෙම කාරණයට ඇති බලපෑම සාකච්ඡා කර ගැටළුව විසඳා ගත යුතුය, මන්ද අධිකාරිය විසින් එය අඛණ්ඩව කරගෙන නොයන ලෙස නියෝග කළ හොත් ව්‍යාපාරයේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි බලපෑමක් ඇති විය හැකිය.

*(පැතිකඩ දෙකක් පමණක් ප්‍රමාණවත්ය)*

***(ලකුණු 03)***

**(b)**

- මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය.
- විශේෂ අරමුණු සහිත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සහතික වීම.
- අභ්‍යන්තර පාලනයේ ප්‍රමාණවත් බව පිළිබඳ සහතික වීම.
- පාරිසරික කරුණු පිළිබඳ සහතික වීම.
- නියාමන අනුකූලතා පිළිබඳ සහතික වීම.
- පද්ධති විශ්වසනීයත්ව වාර්තා.
- ඒකාබද්ධ වාර්තාකරණය පිළිබඳ සහතික වීම.
- තිරසාරභාවය පිළිබඳ වාර්තාකරණය මත සහතික වීම.

*(උදාහරණ දෙකක් පමණක් ප්‍රමාණවත්ය)*

***(ලකුණු 02)***

***(මුළු ලකුණු 05)***

## *4 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

**පරිච්ඡේදය 02**

**(a)**

Shopping.lk හට දැන් සමාජ මාධ්‍ය අන්තර්ගතයන් (WhatsApp" Facebook" TikTok, ආදිය) ක්‍රියාකාරීව නිරීක්ෂණය කර පාරිභෝගික සේවා, නිෂ්පාදන ගුණාත්මකභාවය හෝ සේවා සැපයීමේ ගැටළු පිළිබඳ කාලෝචිත අවබෝධයක් ලබා ගත හැකිය. මෙම අවස්ථාවේදී, පුළුල්ව සහ වහාම ලබා ගත හැකි සමාජ මාධ්‍ය අන්තර්ගතයන් ව්‍යාපාරයේ නිෂ්පාදන සහ සේවාවන් පිළිබඳ මහජන සංජානනය පිළිබඳ වටිනා අවබෝධයක් ලබා දෙන අතර, බරපතල වෙළඳ නාම හෝ බලපත්‍ර හානිවලට තුඩු දීමට පෙර සේවා සහ නිෂ්පාදන වල ගුණාත්මක භාවය පිළිබඳ ගැටළු ඉක්මනින් විසඳා ගත හැකි කළමනාකරණ මෙවලමක් ලෙස Shopping,lk හට කීර්ති නාමයට සිදුවන හානිය වළක්වා ගැනීමට උපකාරී වේ.

***(ලකුණු 03)***

**(b)**

1. අවදානම් වළක්වා ගැනීම
2. අවදානම් පිළිගැනීම
3. අවදානම් පැවරීම
4. අවදානම් අඩු කිරීම
5. අවදානම් බෙදා ගැනීම

(ක්‍රම දෙකක් පමණක් ප්‍රමාණවත්ය)

***(ලකුණු 02)***

***(මුළු ලකුණු** 05**)***

***A* කොටසෙහි අවසානය**

**(මුළු ලකුණු 30)** **B කොටස**

## *5 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

**පරිච්ඡේදය 05 සහ 06**

**(a)**

1. **දළ ලාභ අනුපාතය**: විකුණුම් අඩුවීම හේතුවෙන් දළ ලාභ අනුපාතය 30% සිට 27% දක්වා අඩු වී ඇත.
2. **විකුණුම් විචලනය**: 2025 දී විකුණුම් 10% කින් අඩු වී ඇත. මෙය සැලකිය යුතු අඩුවීමක් බැවින්, මෙම විකුණුම් සත්‍ය වශයෙන්ම සිදුවී ඇත්දැයි තහවුරු කිරීම සඳහා මූලාශ්‍ර ලේඛන සමඟ සත්‍යාපනය කළ යුතු අතර විකුණුම් ප්‍රමාණ සමඟද සංසන්දනය කළ යුතුය.
3. **තොග තක්සේරුව**: මූල්‍ය ප්‍රකාශනවල තොගය අධි ගණනය කර ඇත. විගණන සැලැස්ම සකස් කිරීමේදී මෙය සැලකිල්ලට ගත යුතුය.
4. **විගණන සාක්ෂි නොමැතිකම**: ඇතැම් ඉන්වොයිස් සමාගම සතුව නොමැත.
5. සේවාලාභියාගේ ව්‍යාපාරයේ, සංවිධානයේ හෝ ගිණුම්කරණ පද්ධතියේ ප්‍රධාන වෙනස්කම්.
6. අදාල නීති වල, ගිණුම්කරණ ප්‍රමිතීන්ගේ හෝ සමාගමේ ක්‍රියා පටිපාටිවල වෙනස්කම්.
7. වෙනත් අදාළ පසුබිම් තොරතුරු.
8. පෙර වසරවල ඇති වූ ගැටළු සහ අනෙකුත් ඉදිරියට ගෙන ආ කරුණු.
9. වත්මන් බදු තත්ත්වය.
10. කාලය සහ පිරිවැය අයවැය සහ කාර්ය මණ්ඩල සැලසුම්.
11. කාලසටහන සහ සේවාලාභියාගෙන් ලැබෙන ගිණුම්කරණ සහාය.
12. සමස්ත විගණන උපාය මාර්ගය.
13. අභ්‍යන්තර පාලනය මත රඳා පැවතීමේ මට්ටම සඳහන් කරමින්, එක් එක් ප්‍රධාන ක්ෂේත්‍රය සඳහා සවිස්තරාත්මක විගණන ප්‍රවේශය; සහ පාලනය, විශ්ලේෂණාත්මක සමාලෝචනය සහ ප්‍රධාන විගණන ක්‍රියා පටිපාටි සඳහා ආසන්න නියැදි ප්‍රමාණ ලබා දීම.

*(කරුණු තුනක් පමණක් ප්‍රමාණවත්ය)*

***(ලකුණු 03)***

**(b)**

1. තොග භෞතික සත්‍යාපනය නිරීක්ෂණය කරන්න.
2. කාලසීමා විශ්ලේෂණය.
3. තොග අගය කිරීම පරීක්ෂා කරන්න.
4. පද්ධතියේ ශේෂය සමඟ භෞතික තොග ශේෂය පරීක්ෂා කරන්න.
5. තොග රඳවා ගැනීමේ කාලය ගණනය කරන්න.
6. විකුණුම් ඉන්වොයිසි පරීක්ෂා කරන්න.
7. තොග සඳහා නිවැරදිව ගිණුම්කරණය ආකාරයන් යොදවාගෙන තිබේද යන්න පරීක්ෂා කරන්න.

*(විගණන පටිපාටි හතරක් පමණක් ප්‍රමාණවත්ය)*

***(ලකුණු 04)***

**(c)** විගණක විසින් අදාළ සංගහනයක් තුළ ඇති අයිතමයන්ගෙන් 100% කට වඩා අඩු ප්‍රමාණයකට විගණන ක්‍රියා පටිපාටි යෙදවීමයි. එමගින් සමස්ත නියැදි ඒකක සඳහා තෝරා ගැනීමේ අවස්ථාව විගණකවරයාට ලබා දී සමස්ත සංගහනය පිළිබඳව නිගමනවලට එළඹීමට සාධාරණ පදනමක් ලබා දෙයි.

***(ලකුණු 03)***

***(මුළු ලකුණු 10)***

aat SRI LANKA

## *6 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

**පරිච්ඡේදය 07**

**(a)**

2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා SJ Lanka Constructµon (පෞද්ගලික) සමාගමෙහි විගණන මතයට හඳුනාගත් කරුණුවල බලපෑම තක්සේරු කිරීම සඳහා, අපි එක් එක් ගැටලුව පහත සඳහන් පරිදි විශ්ලේෂණය කළ යුතුය:

1. ප්‍රමාණාත්මක බව - සාවද්‍ය ප්‍රකාශය හෝ සීමාව වැදගත් ද යන්න.
2. පුළුල් බව - එය මූල්‍ය ප්‍රකාශනවල බොහෝ අංගවලට හෝ සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවලට බලපාන්නේද යන්න.
3. ගැටලුවේ ස්වභාවය - එය සාවද්‍ය ප්‍රකාශයක් ද නැතහොත් විෂය පථයේ සීමාවක් ද යන්න.

**1 වන කරුණ: රුපියල් මිලියන 8 ක තොග සත්‍යාපනය කිරීමට නොහැකි වීම.**

- **ස්වභාවය:** විගණන විෂය පථයේ සීමාවකි - මුලාශ්‍ර ලියකියවිලි හෝ තොග භෞතික සත්‍යාපනයක් නොමැති අතර විකල්ප ක්‍රියා පටිපාටි කළ නොහැකි විය.
- **ප්‍රමාණාත්මක බව:** රුපියල් මිලියන 8, රුපියල් මිලියන 2.5 ක ප්‍රමාණාත්මක සීමාවට වඩා වැඩි බැවින් මෙය ප්‍රමාණාත්මක වේ.
- **පුළුල් බව:**
  - තොගය යනු ජංගම වත්කම්වල සැලකිය යුතු අංගයකි.
  - ප්‍රමාණාත්මක අයිතමයක් සම්බන්ධයෙන් විගණකවරයාට ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගත නොහැකි නම් සහ එය ක්ෂේත්‍ර කිහිපයකට (උදා: විකුණුම් පිරිවැය, ලාභය) බලපාන්නේ නම්, එය පුළුල් ලෙස සැලකිය හැකිය.

**නිගමනය:**

- විෂය පථයේ සීමාව හේතුවෙන් අදාළ බලපෑම පුළුල් නොවේ නම් තත්වාගණනය කල මතයක්, හෝ
- එකී බලපෑම ප්‍රමාණාත්මක සහ පුළුල් නම් මතය වියාචනය කිරීමක් සිදු කල යුතුය.

SRI LANKA

**2 වන කරුණ: ණය පොලී වියදම් ගිණුම්කරණයට අදාල සාවද්‍ය ප්‍රකාශය (රු. මිලියන 2.45)**

- **ස්වභාවය:** සාවද්‍ය ප්‍රකාශය - වර්ගීකරණ දෝෂය: LKAS 23ට අනුව ණය පොළිය ප්‍රාග්ධනීකරණය කල යුතු වුවද වියදමක් ලෙස හඳුනා ගන්නා ලදී.
- **ප්‍රමාණාත්මක බව:** රුපියල් මිලියන 2.45, රුපියල් මිලියන 2.5 ක ප්‍රමාණාත්මක සීමාවට ආසන්න බැවින් එය ප්‍රමාණාත්මක ලෙස සැලකේ.
- **පුළුල් බව:** මෙය බදු පෙර ලාභය, මූල්‍ය පිරිවැය සහ දේපළ, පිරියත සහ උපකරණ (නොනිමි ප්‍රාග්ධන) කෙරෙහි බලපාන නමුත් සමස්ත මූල්‍ය ප්‍රකාශන පුරා පැතිරෙන්නේ නැත.

**නිගමනය:** මෙය ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හේතුවෙන් තත්වාගණනය කළ මතයක් සඳහා හේතු වේ.

***(ලකුණු 06)***

**(b)**

1. වංචාවක් හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනවලින් තොරද යන්න පිළිබඳව සාධාරණ සහතිකයක් ලබා ගැනීම.

2. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත (SLAuS) ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන මත විගනකගේ සොයාගැනීම් අවශ්‍ය පරිදි වාර්තා කිරීම සහ සන්නිවේදනය කිරීම.

***(ලකුණු 04)***

***(මුළු ලකුණු 10)***

## *7 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

| පරිච්ඡේදය 08 - ආචාරධර්ම අවශ්‍යතා |
|---|

**(a)**

**1. ස්වයං-ඇල්ම මත තර්ජනය**

- **විස්තරයඃ** කුමාර, WA associates විසින් අභ්‍යන්තර විගණනය සිදු කරන සේවාලාභී ආයතනක් වන RF Hotel (පෞද්ගලික) සමාගමේ සාමාන්‍යාධිකාරී (විරාජ්) හරහා ආරම්භ වූ ව්‍යාපාරික සම්බන්ධතාවයකින් (සංචාරක ප්‍රවාහන සේවා) මූල්‍යමය වශයෙන් ප්‍රතිලාභ ලබයි. තවද විරාජ් විසින් විගණන ගාස්තුවැඩ 40% කින් වැඩි කිරීමට කටයුතු යොදා ඇති අතර එය සැලකිය යුතු මුදලකි. නමුත් එය දෙපාර්ශවයටම තාර්කිකව පිළිගත හැකි නම් එය පිළිගත හැකිය.
- **ආචාර ධර්ම සඳහා බලපෑමඃ** කුමාර තම බාහිර ආදායම් මාර්ගය ආරක්ෂා කර ගැනීම සඳහා සේවාදායකයාගේ කළමනාකාරිත්වයට පක්ෂව කටයුතු කිරීමට නැඹුරු විය හැකි බැවින්, මෙය සෘජු මූල්‍ය උනන්දුවක් ඇති කරයි, එය අරමුණුගතභාවය සහ වෘත්තීය විනිශ්චය අඩාල කළ හැකිය.

**2. සුහදශීලී වීමේ තර්ජනය**

- **විස්තරයඃ** කුමාර, විරාජ් සමඟ සමීප පෞද්ගලික සහ වෘත්තීය සම්බන්ධතාවයක් ගොඩනඟා ගෙන ඇත. කුමාර අභ්‍යන්තර විගණන කණ්ඩායමේ සාමාජිකයෙකු වීම සහ විගණන ගාස්තු 40% කින් වැඩි කිරීම වැනි කරුණු මත ඔහු විරාජ්ගේ අවශ්‍යතා කෙරෙහි ඕනෑවට වඩා අනුකම්පා කිරීමේ අවදානමක් ඇත. තවද ඒදජදජ්ජි පසුගිය වසර හතක කාලය තුළ අභ්‍යන්තර විගණකවරයා වේ. එබැවින් විගණන කාර්යයන් සහ පුද්ගලයින් ඕනෑවට වඩා සුහදශීලී විය හැකි අතර එය වෘත්තීය විනිශ්චයට සහ හැසිරීමට බලපෑම් ඇති කරයි.

- **ආචාර ධර්ම සඳහා බලපෑමඃ** මෙය අවංක බව, අරමුණුගතභාවය සහ වෘත්තීය විනිශ්චයට බලපෑම ඇති කළ හැකිය, මන්ද විගණනයේ තීරණ හෝ සොයාගැනීම් වලට පුද්ගලික සබඳතා මගින් බලපෑම් ඇති කළ හැකිය.

***(ලකුණු 06)***

**(b)**

**1. විගණන සමාගම තුළ රාජකාරි වෙන් කිරීම**

RF Hotel (පෞද්ගලික) සමාගමේ අභ්‍යන්තර විගණනය සිදු කිරීම සඳහා වෙනත් හවුල්කරුවෙකු හෝ විගණන කණ්ඩායමක් (කුමාර හැර) පත් කිරීම, එමඟින් කුමාර සේවාලාභී සම්බන්ධතාවයෙන් ඈත් වේ.

**2. පාලනය සඳහා වගකිව යුතු පාර්ශවයන් දැනුවත් කිරීම**

විරාජ් සමඟ කුමාරගේ ව්‍යාපාරික සම්බන්ධතාවයේ (සංචාරක ප්‍රවාහන සේවාව) ස්වභාවය RF Hotel හි විගණන කමිටුවට හෝ අධ්‍යක්ෂ මණ්ඩලයට සම්පූර්ණයෙන්ම හෙළි කිරීම, එමඟින් ඔවුන්ට ඇල්ම මත පන නැගිය හැකි ගැටුම තක්සේරු කිරීමට ඉඩ සැලසේ.

**3. ස්වාධීනත්වය සමාලෝචනය හෝ තත්ත්ව පාලනය**

අභ්‍යන්තර විගණන කටයුතු සහ වාර්තා සමාලෝචනය කිරීම සඳහා ස්වාධීන හවුල්කරුවෙකු (විගණනයට හෝ ව්‍යාපාරික සම්බන්ධතාවයට සම්බන්ධ නොවන) සම්බන්ධ කරවීම, විශේෂයෙන් කළමනාකරණයෙන් බලපෑමට ලක් වූ ඕනෑම ක්ෂේත්‍රයක් සඳහා (උදාඃ ගාස්තු වැඩිවීම්).

**4. විගණන නොවන ව්‍යාපාර ගනුදෙනු සීමා කිරීම**

WA Associate විසින් විගණන හවුල්කරුවන්ට සේවාලාභී කළමනාකරණය සමඟ බාහිර ව්‍යාපාරික සබඳතාවලට ඇතුළු වීම හෝ සේවාලාභී යොමු කිරීම් හරහා පුද්ගලික මූල්‍ය ප්‍රතිලාභ ලබා ගැනීම තහනම් කරන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළ යුතුය.

**විගණන ආයතන මට්ටමේ ආරක්ෂිත ක්‍රම**

1. මූලික මූලධර්මවලට අනුකූල වීමේ වැදගත්කම අවධාරණය කරන සමාගමේ නායකත්වය.
2. සහතික කිරීමේ කණ්ඩායමක සාමාජිකයින් මහජන යහපත වෙනුවෙන් ක්‍රියා කරනු ඇතැයි අපේක්ෂා කරන සමාගමේ නායකත්වය.
3. විගණන කටයුතුවල තත්ත්ව පාලනය ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි.
4. මූලික මූලධර්මවලට අනුකූල වීම සඳහා තර්ජන හඳුනා ගැනීමේ අවශ්‍යතාවය, එම තර්ජනවල වැදගත්කම ඇගයීම සහ තර්ජන ඉවත් කිරීම හෝ අඩු කිරීම සඳහා ආරක්ෂක පියවර යෙදීම පිළිබඳ ලේඛනගත ප්‍රතිපත්ති.
5. මූලික මූලධර්මවලට අනුකූල වීම අවශ්‍ය වන ලේඛනගත අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි.
6. විගණන ආයතනය හෝ විගණන කණ්ඩායම්වල සාමාජිකයින් සහ සේවාලාභීන් අතර අවශ්‍යතා හෝ සබඳතා හඳුනා ගැනීමට හැකි වන ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි.
7. තනි සේවාලාභියෙකුගෙන් ලැබෙන ආදායම මත යැපීම නිරීක්ෂණය කිරීමට සහ අවශ්‍ය නම් කළමනාකරණය කිරීමට ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි.
8. සහතික කිරීමේ සේවාලාභියෙකුට සහතික නොවන සේවා සැපයීම සඳහා වෙනම වාර්තාකරණ මාර්ග සහිත විවිධ හවුල්කරුවන් සහ විගණන කණ්ඩායම් භාවිතා කිරීම.
9. විගණන කණ්ඩායමක සාමාජිකයින් නොවන පුද්ගලයින් කටයුතු ප්‍රතිඵලයට නුසුදුසු ලෙස බලපෑම් කිරීම තහනම් කිරීමේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි.

*(ආරක්ෂිත ක්‍රම හතරක් හඳුනා ගැනීම ප්‍රමාණවත්ය)*

***(ලකුණු 04)***

***(මුළු ලකුණු 10)***

aat SRI LANKA

***B* කොටසෙහි අවසානය**

## 8 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

| පරිච්ඡේදය 03 |
|---|

**(a)**

**1. පාලන පරිසරය**

මෙය සංවිධානයේ ස්වරය සකසන අතර අභ්‍යන්තර පාලනයේ අනෙකුත් සියලුම සංරචක සඳහා පදනම සාදයි. එයට ආචාර ධර්ම වටිනාකම්, කළමනාකරණ දිශානතිය, ආයතනික ව්‍යුහය සහ අධිකාරිය සහ වගකීම පැවරීම වැනි අංග ඇතුළත් වේ.

**2. අවදානම් තක්සේරුව**

අවදානම් තක්සේරුවට අරමුණු සාක්ෂාත් කර ගැනීමට බලපෑ හැකි අවදානම් හඳුනා ගැනීම සහ විශ්ලේෂණය කිරීම ඇතුළත් වේ. එය කළමනාකරණයට විභව තර්ජන අපේක්ෂා කිරීමට සහ එම අවදානම් අවම කිරීම සඳහා ඵලදායී පාලනයන් ක්‍රියාත්මක කිරීමට හැකියාව ලබා දෙයි.

**3. පාලන ක්‍රියාකාරකම්**

මේවා විශේෂිත අරමුණක් ඉටු කිරීම සඳහා නිර්මාණය කර ඇති අභ්‍යන්තර පාලනයන් වේ. සාමාන්‍යයෙන්, විගණනයකට අදාළ විය හැකි පාලන ක්‍රියාකාරකම් පහත සඳහන් දේට අදාළ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ලෙස වර්ගීකරණය කළ හැකිය.
රාජකාරි වෙන් කිරීම

- භෞතික පාලනයන්
- බලය පැවරීම සහ අනුමැතිය
- කළමනාකරණ පාලනයන්
- අධීක්ෂණ පාලනයන්
- සංවිධාන පාලනයන්
- අංක ගණිතමය සහ ගිණුම්කරණ පාලනයන්
- පුද්ගල පාලනයන්

**4. තොරතුරු සහ සන්නිවේදනය**

තොරතුරු සහ සන්නිවේදනය යනු සමාගමේ මෙහෙයුම් සිදු කිරීම, කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ග්‍රහණය කර හුවමාරු කර ගැනීමේ ක්‍රියාවලියයි. එබැවින්, අභ්‍යන්තර පාලනයේ තොරතුරු සහ සන්නිවේදන සංරචකය කළමනාකරණයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය පූර්ව අවශ්‍යතාවයකි. ඵලදායී තීරණ ගැනීම සඳහා, කළමනාකරුවන්ට කාලෝචිත, විශ්වාසදායක සහ අදාළ තොරතුරු වෙත ප්‍රවේශය තිබිය යුතුය.

**5. අධීක්ෂණය**

මෙය අභ්‍යන්තර පාලනයේ ගුණාත්මකභාවය තක්සේරු කිරීමට යොමු වේ. අධීක්ෂණ ක්‍රියාකාරකම් මඟින් සංවිධානයකට තම ඉලක්ක සපුරා ගැනීමට අපහසු විය හැකි පාලන පද්ධතියේ ඇති විය හැකි සහ සත්‍ය බිඳවැටීම් පිළිබඳ තොරතුරු සපයයි. අභ්‍යන්තර පාලනයන් නිරීක්ෂණය කිරීමේ වගකීම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

(සංරචක දෙකක් පමණක් ප්‍රමාණවත්ය.)

***(ලකුණු 04)***

**(b)**

**(i)**

1. අනුමැතියකින් තොරව ඇඟිලි සලකුණු දත්ත හස්තමය ආකාරයට නිවැරදි කිරීම
2. රාජකාරි වෙන් කිරීමක් නොමැතිකම - කමල් විසින් සේවක පැමිණීම සහ අත්තිකාරම් යන දෙකම හසුරුවයි, මුදල් අයකැමිගේ කාර්යයන් සහ සුළු මුදල් ගෙවීම් යන දෙකම අජිත් විසින් සිදු කරන ලදී.
3. නිසි පද්ධති පදනම් වාර්තා නොමැතිව මුදල් වලින් ගෙවන ලද අත්තිකාරම්.
4. සුළු මුදල් ගෙවීම් සඳහා විකුණුම් වලින් ලද මුදල් භාවිතය.
5. වැටුප් පත්‍රිකා ගැලපීම අනුමැතියකින් තොරව හස්තමය ආකාරයට සිදු කිරීම.

(දුර්වලතා හතරක් පමණක් ප්‍රමාණවත්ය.)

***(ලකුණු 04)***

***(ii)***

1. ඇඟිලි සලකුණු පැමිණීමේ මෘදුකාංග වාර්තාවල සිදු කරන ලද ඕනෑම වෙනසක් සඳහා ලේඛනගත අධීක්ෂක හෝ කළමනාකරුගේ අනුමැතිය අවශ්‍ය වේ.
2. වාර්තා තබා ගැනීම සහ මුදල් හැසිරවීම යන දෙකම කෙරෙහි කිසිවෙකුට පූර්ණ පාලනයක් නොමැති වන පරිදි රාජකාරි වෙන් කිරීම.
3. අනුමත කිරීම් සහ රිසිට්පත් සමඟ සියලුම සේවක අත්තිකාරම් වැටුප් ආරක්ෂිත මානව සම්පත් පද්ධතියක ස්වයංක්‍රීය කර වාර්තා කිරීම.
4. සියලුම දෛනික විකුණුම් එකතු කිරීම් නොවෙනස්ව බැංකුගත කර ඇති බවත්, බලයලත් මාර්ග හරහා පමණක් සුළු මුදල් ප්‍රතිපූරණය කරන බවත් සහතික කර කිරීම.
5. වැටුප් පත්‍රිකා සකස් කිරීම සඳහා නිසි අනුමැතිය ලබා ගැනීම.

(නිර්දේශ හතරක් පමණක් ප්‍රමාණවත්ය.)

***(ලකුණු 04)***

***(c)***

පහත සඳහන් හේතූන් නිසා අභ්‍යන්තර පාලනයන්හි ආවේණික සීමාවන් තිබේ:

1. පාලනයන් හොඳින් සැලසුම් කර නොතිබිය හැකිය.
2. අවශ්‍ය පරිදි පාලනයන් ක්‍රියාත්මක නොකළ හැකිය. එබැවින් හොඳින් සැලසුම් කරන ලද පාලනයට පවා එහි අරමුණු සාක්ෂාත් කර ගැනීමට නොහැකි විය හැකිය.
3. මෙහෙයුම් අවදානම් වල වෙනස්කම් දිගටම පැවතීම. මෙහි ප්‍රතිඵලයක් ලෙස කලින් සැලසුම් කරන ලද පාලනයන් නව අවදානම් වලට ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීම.
4. පාලනයන් සැලසුම් කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ පිරිවැය එම පාලනයන්ගෙන් ලබා ගන්නා ප්‍රතිලාභ සාධාරණීකරණය නොකරයි.
5. සංවිධානය තුළ දුර්වල අවදානම් දැනුවත් කිරීමේ සංස්කෘතියක්.

එබැවින්, LGPL ආයතනයට සංවිධානය තුළ සම්පූර්ණයෙන්ම දෝෂ රහිත පාලනයන් අපේක්ෂා කළ නොහැක.

***(ලකුණු 04)***

**(d)**

| පියවර | අරමුණ |
|---|---|
| පැමිණීම වාර්තා කිරීම | සේවකයින්ට ගෙවනු ලබන්නේ සැබවින්ම සිදු කරන ලද වැඩ හෝ සහභාගී වූ දින සඳහා පමණි |
| වැටුප් ගණනය කිරීම | • සැබෑ සේවකයින්ට පමණක් ගෙවනු ලබන අතර ව්‍යාජ සේවකයින් නොමැත<br>• සේවකයින්ට නිවැරදි අනුපාතයට ගෙවනු ලැබේ<br>• අඩු කිරීම් නිවැරදිව සලකා බලනු ලැබේ |
| සංශෝධන | නිවැරදි සේවකයාට නිවැරදිව යාවත්කාලීන කර ඇත |
| ගෙවීම් | • සේවකයින්ට සහ බදු අධිකාරීන් සහ අර්ථසාධක අරමුදල් වැනි |

| | |
|---|---|
| | අනෙකුත් බලධාරීන්ට නිවැරදි මුදල් ගෙවනු ලැබේ<br>• ගෙවීම් නියමිත වේලාවට සිදු කෙරේ<br>• නිවැරදි සේවකයාට ගෙවීම සිදු කෙරේ |
| වාර්තා කිරීම | • වැටුප් සම්බන්ධ සියලුම ගෙවීම් නිවැරදි කාල සීමාව තුළ සහ නිවැරදි ගිණුම්වල නිවැරදිව සටහන් කර ඇත |

(අරමුණු තුනක් පමණක් ප්‍රමාණවත්ය.)

***(ලකුණු 03)***

**(e)**

| යෙදුම් පාලන | උදාහරණය |
|---|---|
| යෙදවුම් මත පාලනයන් (සම්පූර්ණත්වය) | • පාලන එකතුන් පිළිබඳ හස්තමය සහ වැඩසටහන්ගත එකඟතාවය<br>• ලේඛන ගණනය<br>• මූලාශ්‍ර ලියවිලි සමග සැකසූ නිමැවුම් එකිනෙක පරීක්ෂා කිරීම<br>• අපේක්ෂිත යෙදවුම් පාලන ගොනුවක් වැඩසටහන්ගත කළ යෙදවුම් සමග ගැලපීම<br>• ප්‍රතික්ෂේපිත අයිතම නැවත ඉදිරිපත් කිරීමට අදාල ක්‍රියා පටිපාටි |
| යෙදවුම් නිරවද්‍යතාවය මත පාලනයන් | පිළිගත හැකි බව සඳහා යෙදවුම් දත්ත ක්ෂේත්‍ර පරීක්ෂා කිරීම සඳහා ක්‍රියා පටිපාටි (උදාහරණයක් ලෙස අගය, යොමු අංකය, දිනය).<br>• අංක සත්‍යාපනය<br>○ සාධාරණත්වය පරීක්ෂාව<br>○ පැවැත්ම පරීක්ෂා කිරීම<br>○ අනුලක්ෂණ පරීක්ෂාව<br>○ අවශ්‍ය තොරතුරු<br>○ ඉඩදෙන ලද පරාසය<br>• නිමවුම් හස්තමය ආකාරයට පරීක්ෂා කිරීම සහ මූලාශ්‍රය සමග සංසන්දනය කිරීම<br>• පාලන එකතුන් වල එකඟතාවය |
| යෙදවුම් අනුමත කිරීමට අදාල පාලනයන් | • තොරතුරු යෙදවුම් සඳහා අවසර දී ඇති බව සහතික කිරීම සඳහා හස්ත ක්‍රමයට පරීක්ෂා කිරීම්<br>• බලයලත් පුද්ගලයින් විසින් යෙදවුම් ඇතුලත් කිරීම |
| සැකසීම් පිළිබඳ පාලනයන් | • යෙදවුම් සම්පූර්ණ වූ විට යෙදවුමට සමාන පාලනයන් ක්‍රියාත්මක විය යුතුය. (උදා: කණ්ඩායම් සංසන්දනය)<br>• තිරය මගින් අනතුරු ඇඟවීම් මගින් සැකසීම සම්පූර්ණ වීමට පෙර පුද්ගලයින් ඉවත් වීම වැළැක්විය හැකිය. |
| ප්‍රධාන ගොනු සහ ස්ථාවර දත්ත මත පාලනයන් | • එකිනෙක පරීක්ෂා කිරීම<br>• සියලුම ප්‍රධාන ගොනු සහ ස්ථාවර දත්තවල චක්‍රීය සමාලෝචන<br>• ප්‍රධාන ගොනු භාවිතා කරන විට මකාදැමීම් නොමැති බව සහතික කිරීම සඳහා භාවිතා කරන වාර්තා ගණන් (සකසන ලද ලියකියවිලි ගණන) සහ හැෂ් එකතුව (උදාහරණයක් ලෙස, සියලුම වැටුප් අංකවල එකතුව)<br>• වත්මන් ශේෂයක් නොමැති ගිණුම් මකා දැමීම පාලනය කිරීම |

(එක් එක් පාලනයන් සඳහා උදාහරණයක් සහිතව පාලනයන් තුනක් පමණක් ප්‍රමාණවත්ය.)

***(ලකුණු 06)***

***(මුළු ලකුණු 25)***

## *9 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

**පරිච්ඡේදය 05 සහ 06**

**(a)**

- ආදායම් හඳුනාගැනීම
    - විවිධ ප්‍රවාහයන්ගෙන් ලද ඉහල අදයම (නේවාසික, බාහිර රෝගී අංශය, ෆාමසිය).
    - ප්‍රධාන විධායක නිලධාරියාගේ ප්‍රසාද දීමනාව ආදායමට බැඳී ඇති බැවින් ආදායම් අධි තක්සේරුවේ අවදානම.
- වැටුප් සහ වෛද්‍ය ගාස්තු
    - ඒකාබද්ධව ආදායමෙන් 20% ඉක්මවීම - ලාභ ආන්තිකයට බලපෑ හැකිය; වැරදි වර්ගීකරණයේ හෝ අවතක්සේරු කිරීමේ අවදානමක් ඇත.
- සම්බන්ධිත පාර්ශව ගනුදෙනුව
    - මව් සමාගමට ලබා දී ඇති ණය (රු. මිලියන 5) නිසි හෙළිදරව් කිරීමක් සහ සාධාරණ ඉදිරිපත් කිරීමක් අවශ්‍ය වේ.
- ලාභ ආන්තික පහත වැටීම
    - එය මෙහෙයුම් ගැටළු, වැඩි වූ පිරිවැය හෝ විය හැකි සාවද්‍ය ප්‍රකාශන නිසාද යන්න තීරණය කිරීමට විශ්ලේෂණයක් අවශ්‍ය වේ.

***(ලකුණු 04)***

**(b) සමස්ත විගණන උපයමර්ගයෙහි ඇතුලත් කල යුතු කරුණු**

| | |
|---|---|
| විගණන කාර්යභාරයෙහි ලක්ෂණ | • මූල්‍ය වාර්තාකරණ රාමුව<br>• කර්මාන්තයට විශේෂිත වාර්තාකරණ අවශ්‍යතා<br>• අපේක්ෂිත විගණන ආවරණය (උදා: ස්ථාන ගණන)<br>• පාලන සම්බන්ධතාවල ස්වභාවය (උදා: කණ්ඩායම් විගණන)<br>• ව්‍යාපාර අංශවල ස්වභාවය<br>• භාවිතා කළ යුතු වාර්තාකරණ මුදල් වර්ගය<br>• අභ්‍යන්තර විගණන කටයුතු ලබා ගැනීමේ හැකියාව<br>• සේවා සංවිධාන භාවිතය (ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණය) සහ ඔවුන් පාලනයන් නිර්මාණය කර ඇති ආකාරය<br>• පෙර විගණනවලින් ලබාගත් විගණන සාක්ෂි<br>• විගණන ක්‍රියා පටිපාටිවලට තොරතුරු තාක්ෂණයේ බලපෑම<br>• සේවාලාභියාගේ පුද්ගලයන්ට සහ දත්ත වලට පිවිසීමේ හැකියාව |
| වාර්තා කිරීමේ අරමුණු, විගණනයේ කාල සීමාව සහ සන්නිවේදනයේ ස්වභාවය | • ආයතනයේ මූල්‍ය වාර්තාකරණ කාලසටහන<br>• කළමනාකරණය සහ පාලනයට වගකිව යුතු පාර්ශවයන් සමඟ රැස්වීම් සංවිධානය කිරීම<br>• වාර්තාවල අපේක්ෂිත වර්ග සහ කාල නියමයන් පිළිබඳව කළමනාකරණය සහ පාලනයට වගකිව යුතු පාර්ශවයන් සමඟ සාකච්ඡා කිරීම<br>• විගණනයේ තත්ත්වය සම්බන්ධයෙන් අපේක්ෂිත සන්නිවේදනය සම්බන්ධතාවය පුරාවට<br>    • සංරචක විගණකවරුන් සමඟ අපේක්ෂිත සන්නිවේදනය<br>    • තෙවන පාර්ශවයන් සමඟ අපේක්ෂිත සන්නිවේදනය |
| සැලකිය යුතු සාධක, මූලික විගණන | • ප්‍රමාණාත්මක බව තීරණය කිරීම<br>• මූල්‍ය ප්‍රකාශන වල සමස්තයක් ලෙස ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන |

| | |
|---|---|
| කාර්යයන් සහ අනෙකුත් විගණන කාර්යයන් තුලින් ලබාගත් දැනුම | සහ එහි බලපෑම සඳහා වැඩි අවදානමක් ඇති ක්ෂේත්‍ර හඳුනා ගැනීම<br>• පෙර විගණනවල ප්‍රතිඵල<br>• වෘත්තීය විනිශ්චය පවත්වා ගැනීමේ අවශ්‍යතාවය<br>• සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ මනා අභ්‍යන්තර පාලනයක් පවත්වා ගැනීම සඳහා කළමනාකාරිත්වයේ කැපවීම පිළිබඳ සාක්ෂි<br>• ගනුදෙනු පරිමාව<br>• සැලකිය යුතු ව්‍යාපාර වර්ධනයන්<br>• සැලකිය යුතු කර්මාන්ත වර්ධනයන්<br>• මූල්‍ය වාර්තාකරණ රාමුවේ සැලකිය යුතු වෙනස්කම්<br>• මෑත කාලීන අනෙකුත් සැලකිය යුතු වර්ධනයන් |
| සම්පත් වල ස්වභාවය, කාලය සහ ප්‍රමාණය | • කාර්යාභාර කණ්ඩායම තෝරා ගැනීම<br>• කණ්ඩායම් සාමාජිකයින්ට වැඩ පැවරීම<br>• විගණන කාර්යභාරයෙහි අයවැයකරණය |

(කරුණු තුනක් පමණක් ප්‍රමාණවත්ය.)

***(ලකුණු 06)***

**(c)**

1. **කර්මාන්ත, නියාමන සහ බාහිර සාධක**
   සෞඛ්‍ය සේවා රෙගුලාසි, මිල පාලනයන් සහ රක්ෂණ පිළිවෙත්.

2. **ආයතනයේ ස්වභාවය**
   එහි මෙහෙයුම්, පිරිනමන සේවාවන් (උදා: මාතෘ සත්කාර, ළමා සේවා), පරිමාණය, හිමිකාරිත්වය සහ පාලන ව්‍යුහය.

3. **අභ්‍යන්තර පාලන පද්ධතිය**
   ERP මෘදුකාංග භාවිතය, රාජකාරි වෙන් කිරීම සහ බිල්පත් සැකසීම, වැටුප් සහ සියලුම ගෙවීම් සඳහා අනුමත කිරීමේ ක්‍රියාවලීන්. අභ්‍යන්තර විගණක විසින් වාර්තා කර ඇති ගැටළු සඳහා විශේෂයෙන් පාලනයන් ක්‍රියාත්මක කිරීම.

4. **මූල්‍ය කාර්ය සාධනය සහ ලාභදායිතාවය**
   ආදායම, වියදම්, ආන්තික වෙනස්කම් සහ ප්‍රධාන මූල්‍ය දර්ශකවල ප්‍රවණතා.

5. **ආයතනයේ අරමුණු සහ උපාය මාර්ග සහ ඒ ආශ්‍රිත ව්‍යාපාර අවදානම**

6. **ව්‍යාපාරයට සහ එහි කර්මාන්තයට අදාලව යෝග්‍යතාවය සහ සංගතතාවය ඇතුලත්ව ව්‍යාපාරයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යෙදීවීම.**

7. **සමාගම එළඹ ඇති එහි මෙහෙයුම් කෙරෙහි බලපෑමක් ඇති කරන සැලකිය යුතු ගිවිසුම්.**

*(ක්ෂේත්‍ර හතරක් පමණක් ප්‍රමාණවත්ය.)*

***(ලකුණු 04)***

**(d)**

1. සේවාලාභියාගේ නම
2. වැඩ පත්‍රිකාවල විෂයපථය, අරමුණ හෝ අන්තර්ගතය
3. ශේෂ පත්‍ර දිනය
4. සකස් කළ දිනය
5. වැඩ පත්‍රිකාවට යොමුව

6. පිළියෙළ කරන නිලධාරියාගේ මුලකුරු
7. සමාලෝචන නිලධාරියාගේ මුලකුරු
8. සමාලෝචන දිනය
9. විගණන වැඩසටහන් ඒවායේ ඇති ඕනෑම වෙනස්කමක් ඇතුළුව සැලසුම් ක්‍රියාවලියේ සාක්ෂි
10. අභ්‍යන්තර විගණනයේ කාර්යය සහ එළඹුණු නිගමන පිළිබඳව විගණකවරුන් සලකා බැලීම පිළිබඳ සාක්ෂි.
11. ගනුදෙනු සහ ශේෂ විශ්ලේෂණය
12. සැලකිය යුතු අනුපාත සහ ප්‍රවණතා විශ්ලේෂණය
13. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනවල අවදානම හඳුනාගෙන තක්සේරු කිරීම.
14. විගණන ක්‍රියා පටිපාටිවල ස්වභාවය, වේලාව, ව්‍යාප්තිය සහ ප්‍රතිඵල පිළිබඳ වාර්තාවක්.
15. සිදු කරන ලද කාර්යය අධීක්ෂණය කර සමාලෝචනය කළ බවට සාක්ෂි
16. විගණන ක්‍රියා පටිපාටි සිදු කළේ කවුරුන්ද සහ ඒවා සිදු කළේ කවදාද යන්න පිළිබඳ ඇඟවීමක්
17. වෙනත් විගණකවරයෙකු විසින් මූල්‍ය ප්‍රකාශන විගණනය කරනු ලබන සංරචක සම්බන්ධයෙන් යොදන ලද විගණන ක්‍රියා පටිපාටි පිළිබඳ විස්තර.
18. ආයතනය සහ එහි පරිසරය අවබෝධ කර ගැනීමේදී ලබාගත් තොරතුරු.

*(අයිතම පහක් පමණක් ප්‍රමාණවත්ය.)*

***(ලකුණු 05)***

**(e)**

**1. පරීක්ෂාව**

**අර්ථ දැක්වීම**: වාර්තා හෝ භෞතික වත්කම් පරීක්ෂා කිරීම.

උදාහරණ:

i. නිවැරදි බිල්පත් සත්‍යාපනය කිරීම සඳහා නේවාසික රෝගී ආදායමේ නියැදියක් සඳහා ඉන්වොයිසි සහ නික්මීමේ වාර්තා සාරාංශ පරීක්ෂා කිරීම.
ii. වැටුප් පරීක්ෂාව සඳහා වෛද්‍ය ගිවිසුම් සහ වැටුප් විස්තර තහවුරු කිරීම සඳහා මානව සම්පත් ගොනු පරීක්ෂා කිරීම.
iii. බැංකු ප්‍රකාශන පරීක්ෂා කිරීම.
iv. ණය ගිවිසුම් පරීක්ෂා කිරීම.
v. ඉඩමක හිමිකම් ඔප්පුව පරීක්ෂා කිරීම.

**2. විශ්ලේෂණාත්මක ක්‍රියා පටිපාටි**

අර්ථ දැක්වීම: මූල්‍ය සහ මූල්‍ය නොවන දත්ත අතර පිළිගත හැකි සම්බන්ධතා අධ්‍යයනය කිරීමෙන් මූල්‍ය තොරතුරු ඇගයීම.

උදාහරණ:

i. අසාමාන්‍ය ප්‍රවණතා හඳුනා ගැනීම සඳහා එක් ඇඳකින් මෙම වසරේ ලද ආදායම පෙර වසර සහ කර්මාන්ත සාමාන්‍යයන් සමඟ සැසඳීම.
ii. ලාභදායිතාවය අඩුවීමට හේතු විමර්ශනය කිරීම සඳහා අනුපාත විශ්ලේෂණය (උදා: වැටුප්/ආදායම, ලාභ ආන්තිකය) සිදු කිරීම.
iii. පුරෝකථන සහ අයවැය වැනි අපේක්ෂිත ප්‍රතිඵල.
iv. (එක් කිර්යා පටිපාටියක් සඳහා උදාහරණ දෙකක් පමණක් ප්‍රමාණවත්ය.)

***(ලකුණු 06)***

***(මුළු ලකුණු 25)***

***C* කොටසෙහි අවසානය**

SRI LANKA

## *Notice:*

These answers compiled and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.

These should be understood as Suggested Answers to question set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers". The fundamental objective of this publication is to add completeness to its series of study texts, designs especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well as stay relevant in the art of answering questions at examination level.

*© 2021 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka). All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*